# ශ්‍රී ලංකාවේ සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන 2008 - 2012



# ශ්‍රී ලංකාවේ

## සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන
## 2008 - 2012

අප්‍රේල් 2008


brother

# අන්තර්ගතය


ශ්‍රී ලංකාව 1

සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන සහ
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන හා
ජාතික සංවර්ධන ප්‍රමුඛතා අතර සමීප සම්බන්ධතා 3

සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන්
ප්‍රමුඛතා සහ ප්‍රතිඵල 4

ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ව්‍යුහය 10

ඇමුණුම 11








# කෙටි යෙදුම්

| | |
|---|---|
| **ADB** | ආසියානු සංවර්ධන බැංකුව Asian Development Bank |
| **BDS** | ව්‍යවසාය ප්‍රවර්ධන සේවා Business Development Services |
| **CBT** | ප්‍රජා මූලික පුහුණුව Community-Based Training |
| **CCA** | පොදු ජාතික තක්සේරුව Common Country Assessment |
| **DLDPs** | ප්‍රාදේශිය ජීවනෝපය සංවර්ධන සැලසුම් Divisional Livelihood Development Plans |
| **DWCP** | සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන Decent Work Country Programme |
| **FAO** | ආහාර හා කෘෂිකර්ම සංවර්ධන Food and Agriculture Organization |
| **GDP** | දළ ජාතික නිෂ්පාදනය Gross Domestic Product |
| **ILO** | ජාත්‍යන්තර කම්කරු සංවිධානය International Labour Organization |
| **ILS** | ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් International Labour Standards |
| **INGO** | ජාත්‍යන්තර රජ්‍ය නොවන සංවිධාන International Non-governmental Organization |
| **IRAP** | ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රවේශ සැලසුම් Integrated Rural Accessibility Planning |
| **MDG** | සහස්‍ර සංවර්ධන අරමුණු Millennium Development Goals |
| **MSMEs** | සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායන් Micro, Small and Medium Enterprises |
| **NGO** | රාජ්‍ය නොවන සංවිධාන Non-governmental Organization |
| **NLAC** | ජාතික කම්කරු උපදේශක සභාව National Labour Advisory Council |
| **NPADW** | සුනිසි රැකියා පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම National Plan of Action for Decent Work |
| **PHC** | දරිද්‍රතාවය ගණන් බැලීම Poverty Head Count |
| **SIYB** | ඔබේ ව්‍යාපාරය ආරම්භකර දියුණු කරන්න Start and Improve Your Business |
| **TC** | තාක්ෂණික සහයෝගීතාවය Technical Cooperation |
| **TVET** | ශිල්පීය වෘත්තිය අධ්‍යාපනය සහ පුහුණුව Technical Vocational Education and Training |
| **TYDF** | දස අවුරුදු සංවර්ධන වැඩ සටහන Ten Year Horizon Development Framework |
| **UNDAF** | එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහන United Nations Development Assistance Framework |
| **UNDP** | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන United Nations Development Programme |
| **UNHCR** | එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහකොමසාරිස් United Nations High Commissioner for Refugees |
| **UNICEF** | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල United Nations Children's Fund |
| **WFP** | ලෝක ආහාර වැඩ සටහන World Food Programme |
| **NAPYE** | තරුණ රැකියා නියුක්තිය තහවුරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම National Action Plan for Youth Employment |
| **YEN** | තරුණ රැකියා ජාලය Youth Employment Network |

මෙම ලේඛණය මගින් ශ්‍රී ලංකාව සඳහා 2008 - 2012 කාල පරිච්ඡේදය වෙනුවෙන් සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහනක් කෙටුම්පත් කර ඇත. ජාතික සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දායකත්වය, එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩ සටහන් සංවර්ධනය සඳහා අවස්ථා හඳුනාගැනීම සහ පුළුල් සංවර්ධන සහ දරිද්‍රතාවය පිටු දැකීමේ සන්දර්භය තුල "සුනිසි රැකියා අවස්ථා ප්‍රවර්ධනය" ආවරණය වන අයුරින් සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන් රාමුවක් සකස් කර තිබේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කොළඹ කාර්යාලය සිය කෘතඥතාවය සහ ස්තූතිය ශ්‍රී ලංකාව සඳහා "සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන්" නිර්මාණය කිරීමේදී සක්‍රිය කාර්යභාරයක් ඉටුකළ ත්‍රෛයිපාර්ශවීය කණ්ඩායම්වලට සහ අනෙකුත් අදාල පුද්ගලයින් වෙත පිරිනමයි.











ශ්‍රී ලංකාව

වෙළඳපල ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් පසුගිය කාලය තුල ඉතා සාර්ථක අයුරින් අඩු ආදායම් මට්ටමේ සිට මධ්‍යම ආදායම් මට්ටමේ රටක් කරා අවතීර්ණ වී සිටියි. විසිපස් වසරක් පුරා රටට සාපයක් වී ඇති සිවිල් යුද්ධය මෙන්ම, 2004 දී හටගත් සුනාමි ව්‍යසනයටද ඔරොත්තු දීමට ශ්‍රී ලංකාවට හැකි වීම සුවිශේෂ අවස්ථාවකි. එය රටේ ආර්ථිකය ලත් ජයග්‍රහණයකි. එහෙත් ගෝලීයකරණයේ ප්‍රතිඵල උපරිම අයුරින් නෙලාගැනීම සඳහා රට දැඩි පරිශ්‍රමයක නිරතව සිටී. එනිසා සංවර්ධනය ඉලක්ක කරගෙන කෙරෙන අරගලය අභියෝගයක්ව පවතී. රටේ ජනතාවගේ ආයුකාලය, සාක්ෂරතාවය සහ මරණ සංඛ්‍යාව වැනි සමාජ දර්ශක අතින් බලන විට ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල් පසුබාමින් හා සමහර සංවර්ධන රටවල් හා සම තත්ත්වයේ පසු වෙමින් සිටීම ඉතා වැදගත් සංසිද්ධියකි. මානව සංවර්ධන දර්ශකය අනුව ශ්‍රී ලංකාවට 99[1]වන ස්ථානය ලැබී ඇත.

කෘෂිකර්මය පදනම් වූ ආර්ථිකයක සිට සේවා සැපයීම කේන්ද්‍ර කොටගත් ආර්ථිකයක් දක්වා රට පරිවර්තනය වී තිබෙන අතර, 2005 වසරේදී දළ ජාතික නිෂ්පාදනය සඳහා සේවා සැපයීම විසින් 56%, කර්මාන්ත අංශය 27% හා කෘෂිකර්මය 17% ක දායකත්වයක් ලබා දී ඇත. ආර්ථිකය වසා සිටි බැමි වැඩි වැඩියෙන් ලිහිල් කිරීමත් සමගම, රැකියා උත්පාදනයේදී සේවා සැපයීමේ අංශය මුල් පුටුවට පත්ව සිටියි. කෙසේ වුවද ගම්බද පෙදෙස්වල බොහෝ දෙනෙකුගේ රැකියාව කෘෂිකර්මය වී ඇති අතර, ජීවනෝපාය සැලසීමේ මූලාශ්‍රය ද වී ඇත. රටේ ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත්වන්නේද ග්‍රාමීය පෙදෙස්වලය. තවද, රටේ ශ්‍රමබලකායෙන් 60% - 65% අතර ප්‍රමාණයක් අවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ නිරතව සිටී. ඔවුන්ගේ බහුතරය ගම්බද පෙදෙසවලට සීමා වී සිටියි[2].

2007 දී ශ්‍රී ලංකා ආර්ථිකය 6.8% කින් වර්ධනය විය. එමගින් පිළිබිඹුකර ඇත්තේ ඓතිහාසික සාමාන්‍යය වශයෙන් සැලකෙන 4-5%[3] ප්‍රතිශතයේ සිට 6% ඉක්මවා යන දියුණු මාවතක් කරායාමේ විභව ශක්තිය ශ්‍රී ලංකාව සතුව තිබෙන බවයි. ගම්බද ප්‍රදේශවල 15.7%[4] (PHC) සහ වතුකරයේ 32%[5] (PHC) ලෙස පවත්නා දරිද්‍රතාවය සැලකිය යුතු අයුරින් අඩු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංවර්ධන රටාව සමත් වී නොමැති බව සඳහන් කළ යුතුව තිබේ. 2007 වසරේදී ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 1,617 දක්වා ඉහල ගිය අතර, 2007[6] වසරේදී පෞද්ගලික අංශයේ මූර්ති වැටුප්ද විධිමත් ලෙස එලෙසින් වැඩිවිය. 2006 දී මූර්ති වැටුප්වල අඩුවීමක් වාර්තා විය. පඩිපාලක සභාවල පාලනයට යටත් මාසික වැටුපක් ලබන සියළු සේවකයින්ගේ අවම වැටුප් ඉහලයාමක් සිදුවූ බැවින් එය විධිමත් පෞද්ගලික අංශයේ වේතන දර්ශක කෙරෙහි මහත් බලපෑමක් සිදු කිරීමට හේතුවිය.

ඉහල යන මිල මට්ටමට සරිලන පරිදි ස්වකීය වේතනවලට වැඩිවීමක් සිදු නොවන බැවින් අවිධිමත් අංශයේ සේවක පිරිස්වල මූර්ති වැටුප් 2007 දී පිරිහීමට ලක්විය. කලාපය, ලිංග භේදය සහ රාජ්‍ය පෞද්ගලික අංශ යන පාර්ශව වශයෙන් වේතන සහ ආදායම් විෂමතාවයන්හි ගැටළු මතුවිය. රටතුල සාමය ස්ථාපනය කිරීමේ මූලික ක්‍රියාවලියට එරෙහිව, රැකියා ලබාදීමේ සමාන අවස්ථා, ශ්‍රම වෙළඳපල ක්‍රමවත් කිරීම, කුසලතා සංවර්ධන, කාන්තා නියෝජනය සහ සංක්‍රමික ශ්‍රමිකයින් ගැටළුවලට මැදිවීම යනාදියෙන් නිරන්තරයෙන් අභියෝග එල්ලවේ.

සංවර්ධනයේ ප්‍රතිඵල සමාන අයුරින් නෙලා ගැනීම සහ ආර්ථික සංවර්ධනය හා සමාජ සංවර්ධනය සමගාමීව පවත්වාගෙන යාම නොපමාව ඉටුකළ යුතු කාර්‍යයක් වී ඇත. මේ කාරණය සැලකිල්ලට ගත් රජය, "2006 - 2016 දස අවුරුදු සංවර්ධන වැඩ සටහන, මහින්ද චින්තනය සහ නව ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක්" යනාදි වශයෙන් සාර්ව ආර්ථික සහ දුප්පත් ජනතාවගේ සමාජ සංවර්ධන අභියෝග සහ උපාය මාර්ග ආවරණය වන පරිද්දෙන් සැලසුම් රැසක් හඳුන්වා දුනි. ඒමගින් ඉහල යන දරිද්‍රතාවය (ජනගහනයෙන් 15.7%)[7] ප්‍රතිලෝම වශයෙන් සංවර්ධනය සහ දරිද්‍රතාවය එකිනෙක හා

[1]Sri Lanka: Human Development Ranking 2007/08 – URL:
http://hdrstats.undp.org/countries/data_sheets/cty_ds_LKA.html
[2]Labour Force Survey 2007 (4th Quarter) – URL: http://www.statistics.gov.lk/samplesurvey/Bullet20074q.pdf
[3]Sri Lanka Central Bank – Annual Report 2007 – URL:
http://www.cbsl.gov.lk/pics_n_docs/10_publication/_docs/efr/annual_report/Ar2007/Ar_Data2007_E/5_Chap_1_e.pdf
[4]Poverty Indicators 2006/07 – URL: http://www.statistics.gov.lk/poverty/PovertyIndicators.pdf
[5]Ibid
[6]Sri Lanka Central Bank – Annual Report 2007 – URL:
http://www.cbsl.gov.lk/pics_n_docs/10_publication/_docs/efr/annual_report/Ar2007/Ar_Data2007_E/5_Chap_1_e.pdf
[7]DCS Poverty Indicators 2006/07 - URL: www.statistics.gov.lk/poverty/povertyindicators.pdf



ශ්‍රී ලංකාව

බැඳී තිබෙන කලාපීය විෂමතා, විශේෂයෙන් උගත් තරුණ පිරිස් ඇතුළුව, ශ්‍රමික බලකායට අළුතින් එක්වන දශලක්ෂ 2.8 ක් සඳහා රැකියා උත්පාදනය කිරීම, කොන් වී සිටින මෙන්ම අවදානමට නිරන්තරයෙන් ගොදුරු වියහැකි කොටස් (වයස්ගත, කායික දුබලතාවයට ලක්වූ හා අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ ජනතාව) සංවර්ධන ක්‍රියාවට සම්බන්ධ කර ගැනීම, මානව සම්පත් සංවර්ධනය සහ නිවාස සැපයීමේදී වතුකරයේ ජනතාවගේ විශේෂ අවශ්‍යතා අවධානයට ලක්කිරීම, කාන්තාවන්ට සමතැන් ලබාදීම සහ මානව හිමිකම් ප්‍රවර්ධන කිරීම වැනි රටේ සංවර්ධනයට එල්ල වී ඇති ප්‍රධාන අභියෝග සැලකිල්ලට ලක්කොට තිබේ.



**සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන හා ජාතික සංවර්ධන ප්‍රමුඛතා අතර සමීප සම්බන්ධතා**


සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන, ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දී ඇති සහශ්‍ර සංවර්ධන අරමුණු, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහන, සුනිසි රැකියා පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ දස අවුරුදු සංවර්ධන වැඩ සටහන වැනි සංවර්ධන ආධාර සැලසුම් හා සම්බන්ධවී තිබේ. රජය සහ සමාජය නියෝජනය කරන පිරිස්වල පුළුල් සහභාගිත්වය සහ උපදේශක ක්‍රියාවලියකින් පසු, සුනිසි රැකියා සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2006 වසරේදී පිළිගැනීමට ලක්විණි. මෙමගින් මූලිකව දස අවුරුදු සංවර්ධන වැඩ සටහන අඩංගු සර්ව ආර්ථික සංවර්ධන වැඩ සටහන තුළට සමාජ සංවර්ධන න්‍යාය පත්‍රය ඇතුලත් කිරීමේ රජය සතු වගකීම අවධාරණය කර තිබේ.

2008 - 2012 සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන සංවර්ධනය කිරීමේ පදනම සපයන ලද්දේ සුනිසි මෙහෙවර සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම හා දස අවුරුදු සංවර්ධන වැඩ සටහන ඒකාබද්ධව දියත් කරන ලද ප්‍රයත්නයක් මගිනි.

එක්සත් ජාතීන්ගේ පොදු ජාතික අගැයුම් සැලැස්මේ අඩංගු විශ්ලේෂණ සහ නිගමන සැලකිල්ලට ගත් සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන ශ්‍රී ලංකාව මුහුණු දී සිටින ප්‍රධාන සංවර්ධන අභියෝග සහ අවස්ථා හඳුනා ගන්නා ලදි. 2006 ඔක්තෝබරයේදී සම්පූර්ණ කරන ලද එක්සත් ජාතීන්ගේ පොදු ජාතික ඇගයුම් සැලැස්ම ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහනට පදනම සකස් කළේය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහන දරිද්‍රතා කණ්ඩායමේ සම සභාපතිත්වය දැරූ ජාත්‍යන්තර කම්කරු සංවිධානය, අනෙකුත් එක්සත් ජාතීන්ගේ ආයතන සමග එක් වී දරිද්‍රතාවය පිටුදැකීම සඳහා සුනිසි රැකියාව මූලික පදනමක් වශයෙන් උපයෝගී කරගැනීමේ අවශ්‍යතාවය අවධාරනය කළේය. තවදුරටත් ශ්‍රී ලංකාවේ සුනිසි රැකියා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වකීය දායකත්වය සහතික කරනුවස් ජාත්‍යන්තර කම්කරු සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන ක්‍රියාවට නැංවීමේ 2008 - 2012 කාල පරිච්ඡේදය හා ගැලපෙන අයුරින් තම වැඩ සටහන් චක්‍රය වෙනස් කළේය.

පහත ඇමුණුම මගින් සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සහ දස අවුරුදු සංවර්ධන වැඩ සටහන අතර පවත්නා සමීප සබඳතා පෙන්නුම් කරයි.






## සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන් ප්‍රමුඛතා සහ ප්‍රතිඵල

ශ්‍රී ලංකාවේ පවත්නා තත්ත්වය සහ ජනතාවගේ ප්‍රමුඛතා අතර පවත්නා අන්තරය දරිද්‍රතාවය පිටු දැකීම සහ සැමට සුනිසි රැකියා සැපයීමේ සැලසුම විසින් නිර්වචනය කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩි දියුණු කළ සුනිසි රැකියා අවස්ථා, ශ්‍රම වෙළඳපල කළමණාකාරනය සහ අනෙෝන්‍ය සහයෝගිතාවය සහ දියුණුව අරමුණු කරගත් පුළුල් සමාජ සංවාදය යනාදිය නගා සිටුවීම මගින් මෙම ප්‍රමුඛත්ව වැඩ පිළිවෙල යටතේ දරිද්‍රතාවය පිටු දැකීමේ ජාතික උපාය මාර්ග ඌණ පූරණය කිරීම සිදුවේ. දරිද්‍රතාවය පිටු දැකීම සහ සැමට සුනිසි රැකියා යන මෙම විශේෂ කාර්යයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ අනෙකුත් සංවර්ධනයේ පාර්ශකරුවන්ගේ සහභාගිත්වය බෙහෙවින් වැදගත් වී ඇත.

ජාතික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ගෝලීය අරමුණු උපායමාර්ගිකව ඒකාබද්ධ කර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

එක්සත් ජාතීන්ගේ සහ රජයේ සංවර්ධන වැඩ සටහන් සහ තුලනාත්මක වශයෙන් ගත්කළ ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සිදුකර ඇති කාර්‍යයන්හි සාදනීය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම වෙතින් ජාතික වැඩ සටහන් තුනේ ප්‍රතිඵල විමර්ශනයට ලක්විණි.

ජාතික වැඩ සටහන් තුනේ ප්‍රතිඵල මෙසේය :-

**ප්‍රමුඛත්වය : දරිද්‍රතාවය පිටු දැකීම සහ සැමට සුනිසි රැකියා**

**ප්‍රථම ප්‍රතිඵලය** ආර්ථික වශයෙන් පසුබා සිටින, අර්බුදවලට පාත්‍රවූ ප්‍රදේශවල ජනතාවට සුනිසි රැකියාවලට වැඩි වැඩියෙන් ප්‍රවේශවීමේ හැකියාව.

**දෙවන ප්‍රතිඵලය** පුළුල් ශ්‍රම පරිපාලනය සහ සාධාරණ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

**තෙවන ප්‍රතිඵලය** රැකියා සුරක්ෂිතභාවය - ඵලදායිතාව සහ තරගකාරීත්වය යනාදිය බද්ධ කෙරෙන මාර්ග පිළිබඳ ත්‍රෛපාර්ශ්වීය සහයෝගත්වය.

තේමාවන් අවිධිමත් ආර්ථිකය, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් භාවිතය සහ අනුමත කිරීම ප්‍රායෝගික වශයෙන් ඒඩ්ස් වයිරසය සහ ඒඩ්ස් රෝගය පිළිබඳ අනුගමනය කළයුතු ක්‍රියා පද්ධතිය යොදා ගැනීම සහ ස්ත්‍රී / පුරුෂ සම්බන්ධතාවය.







**ප්‍රථම ප්‍රතිඵලය**

**ආර්ථික වශයෙන් පසුබා සිටින සහ අර්බුදවලට ගොදුරුවී ඇති ප්‍රදේශවල වැඩි වැඩියෙන් වඩා හොඳරැකියා අවස්ථාවන් සඳහා පුළුල් ප්‍රවේශයක් ලබා දීම.**

ශ්‍රී ලංකාව සමෘද්ධිමත් ශුභ සාධක රාජ්‍යකට හොඳ ආදර්ශයක් වශයෙන් සැලකිල්ලට භාජනය වී තිබේ. එහෙත් රැකියා සැපයීමේදී සහ ආර්ථික වශයෙන් පසුබා සිටින ජනතාවගේ අභිලාෂයන් සපුරාලීමේදී ශ්‍රී ලංකාවට මහ පරිමානයේ අභියෝගවලට දශක ගණනාවක් පුරා මුහුණ දීමට සිදුවී ඇත. ආර්ථික වශයෙන් පසුබා සිටින ජනතාවට ප්‍රධාන වශයෙන් තරුණ කොටස් අඩංගුව සිටින අතර, ගම්බද පෙදෙස්වල දුගී දුප්පත් ජනතාව, සංක්‍රමිකයින් (විශේෂයෙන් කාන්තාවන්) සුනාමියට සහ වාර්ගික අර්බුදයට කොටුවී සිටින පිරිස් සහ ළමා සොල්දාදුවන් ඇතුලත් වේ.

දරිද්‍රතාවය, වාර්ගික අර්බුදය යනාදියෙන් මිදීමට මෙන්ම සහශ්‍ර සංවර්ධන අරමුණු සහ රටේ දස අවුරුදු සංවර්ධන වැඩ සටහනේ ඉලක්ක ජයගැනීම සඳහා ඵලදායී රැකියා නියුක්තිය එකම තිරසාර මාර්ගය වේ.

දරිද්‍රතාවය අවම කිරීම සඳහා වැඩි වැඩියෙන් වඩා හොඳ රැකියා සඳහා වූ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගිතා වැඩ සටහන පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

- **තරුණ රැකියා නියුක්තිය තහවුරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියම.**
  ශ්‍රී ලංකාවේ රැකියාවල නිරත වීමේ සංස්කෘතිය හුදෙක් ජීවනෝපාය සලසා ගැනීම සඳහා පමණක් නොව, එය ජනතාවගේ අභිලාෂයන් සපුරාලීම, සමාජ තත්ත්වය ආරක්ෂා කරගැනීම සහ සමාජයේ ඉහල තැන්වලට පත්වීම යන කරුණු හා නිසගයෙන් බැඳී තිබේ. ශ්‍රී ලංකා සමාජය අසාධාරණ සහ අසමාන ව්‍යුහයක් වශයෙන් තරුණ පිරිස් සලකති. කුසලතා සංවර්ධනය ඇතුලු රැකියා සේවාවන් හී ඌණතා සහ සම්පත් සහ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ බෙදියාමේදී සිදුවන විෂමතා සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ප්‍රධාන ප්‍රවාහයට සම්බන්ධ ආයතනවල උදාසීනත්වය ද තරුණ අසහනයට හේතුවී තිබේ. මෙම තරුණ අසහනය සහ හැඟීම් පසුගිය දශක තුන තුලදී හටගත් සිවිල් අරගල වලට හේතුවූ අතර, මෙම ගැටළුව ස්වාභාවික විපත් සහ අර්බුද අවස්ථාවලදී යලි යලිත් මතුවන බැව් නිරීක්ෂණය වී තිබේ.

  ශ්‍රී ලංකා රජය 2007 ජූලි වලදී තරුණ රැකියා නියුක්තිය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තරුණ කොටස් සහ අනෙකුත් අදාල පිරිස් සමග සාකච්ඡා කිරීමෙන් පසු, කෙටුම්පත් කිරීම සඳහා මුල පුරන ලදි. එමගින් එම ක්‍රියාවලියේ සුජාතභාවය මෙන්ම එයට උරුමකම් ඇති ශ්‍රී ලාංකික පුද්ගලයින් සතු හිමිකම් ද තහවුරු කෙරිණි. එම සැලැස්ම එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මකවන තරුණ රැකියා නියුක්ති ජාලය විසින් නිර්මාණයකර ඇති 'E4' න්‍යායාත්මක රාමුව, එනම් සමාන අවස්ථා, රැකියා උත්පාදනය, රැකියාවක් සඳහා සුදුසුකම් තිබීම සහ ව්‍යවසාය සංකල්පයට අනුකූලතාවය දක්වයි. ශ්‍රී ලංකාවේ තරුණ රැකියා නියුක්තිය තහවුරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීමේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් ලත් දායකත්වය අතිවිශාලය. එය ඉදිරි වසර පහක කාලයතුල සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා රජය එම සංවිධානයේ සහයෝගය ඉල්ලා තිබේ.

- **වඩා හොඳ රැකියාවන්ට ප්‍රවේශවීම වැඩි දියුණු කිරීම වස්**
  වෘත්තිය පුහුණු උපාය මාර්ග පණගැන්වීම සහ කුසලතා සංවර්ධනය, යුද්ධයෙන් සහ සුනාමියෙන් පීඩාවට පත්ව සිටින ගැහැණු, පිරිමි සහ ළමුන් සඳහා ජීවනෝපාය මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ වෘත්තිය පුහුණුව සඳහා කුසලතා සංවර්ධනය අත්‍යවශයයි. ශිල්පීය වෘත්තිය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ඒකාබද්ධ පද්ධතියක් ඇති කිරීම පහසු කිරීම, පුහුණු ආයතන සංඛ්‍යාව වැඩිකිරීම සහ එවැනි සේවා ග්‍රාමීය සහ අර්බුදයෙන් විපතට පත් ප්‍රදේශ සඳහා යාන්ත්‍රණ ඇති කිරීම පිණිස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අවධානය යොමු වී තිබේ.

- **ජීවනෝපාය අවස්ථා සහ වඩා යහපත් රැකියා ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙවලම් උපයෝගි කරගැනීම සහ පණ ගැන්වීම.**
  ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා අවිධිමත් අංශය තුල සුළු, කුඩා සහ මධ්‍යම මට්ටමේ ව්‍යවසායන්ගේ අභිවෘද්ධිය පිණිස හිතකාරී පසු බිමක් නිර්මාණය කිරීම අත්‍යවශයයි. යුදපෙරමුණේ සිට ආපසු පැමිණෙන පිරිස් (තරුණ, ළමා සොල්දාදුවන්) සහ සුනාමියෙන් බැට කෑ පවුල් මෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් සඳහා ජීවනෝපාය සැලසීමේ අවස්ථා බෙහෙවින් වැදගත් වේ. මෙම ප්‍රදේශවල ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා



රජය, පරිත්‍යාගශීලින්, සංවර්ධන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය අතර පවත්නා සම්බන්ධීකරණය දුර්වල තත්ත්වයක පවති. එබැවින් ප්‍රතිඵල ශුන්‍ය වී ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානය ස්වකීය මෙවලම් (ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රවේශන සැලසුම්, ප්‍රදේශීය ජීවනෝපාය සංවර්ධන සැලසුම්, ප්‍රජා මූලික පුහුණුව, ව්‍යාපාරික සංවර්ධන සේවා සහ "ඔබේ ව්‍යාපාරය ආරම්භකර දියුණුව කරා පියනගන්න" යනාදිය) මගින් සහ වෙනත් සැලසුම් ක්‍රමවේදයන් උපයෝගී කරගනිමින් ජීවනෝපාය අවස්ථා සහ යහපත් රැකියා සඳහා උපකාරිවීමට අධිෂ්ඨාන කරගෙන සිටි.

**වැඩ සටහන් උපාය මාගී :**

අ. ආර්ථික වශයෙන් පසුබා සිටින ජනතාව සඳහා වූ රජයේ ක්‍රියාකාරී සැලසුම් සඳහා කාර්මික සහ උපදේශක සේවාව. - තරුණ රැකියා නියුක්තිය තහවුරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ උපායමාගීය,

ආ. දිස්ත්‍රික්ක මට්ටමෙන් ජීවනෝපාය සම්බන්ධීකරණයට සහය වීම පිණිස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙවලම් සහ සැලසුම් ක්‍රමවේදයන් නගා සිටුවීමේ කාර්මික සහ උපදේශක සහය ලබාදීම.

ඇ. වෙළඳපල ඉල්ලීම ඌණපුර්ණය කිරීම සඳහා වෘත්තිය පුහුණු (VT) ප්‍රතිපත්ති රාමුව සැකසීම මගින් පුහුණුව පිළිබඳ ප්‍රතිපත්තිවලට ගුනාත්මකභාවය සහ සාර්ථකත්වය වැඩි දියුණු කිරීම උදෙසා කාර්මික සහ උපදේශක සහය ලබාදීම.

ඈ. දරිද්‍රතාවය ගහණව පවතින දිස්ත්‍රික්ක ඉලක්ක කරගත් හා ජාතික මට්ටමින් ගැටළු අවධානයට ලක්කරනු ලබන සාදනීය ඒකාබද්ධ කුඩා ව්‍යවසාය සංවර්ධන වැඩ සටහනක් හරහා දරිද්‍රතාවය පිටු දැකීම සහ ගුණාත්මක මට්ටමින් උසස් රැකියා උත්පාදනය කිරීම සඳහා වන රජයේ උපාය මාර්ගික වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වීම.

| දර්ශක | ඉලක්ක |
|---|---|
| i. රජයේ තරුණ රැකියා නියුක්තිය තහවරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලස්ම දියුණුකර අවසන් කිරීම උදෙසා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තේමාගත ක්‍රියාකාරී කංඩායම් පිහිටුවීම<br>ii. රැකියා වියුක්තිය වැඩිවීමේ ප්‍රමාණය අඩුකිරීම<br>iii. තරුණ පිරිස් සහ අඩු ආදායම් සහිත පිරිස් විසින් රැකියා වියුක්ති සේවා ප්‍රයෝජනයට ගැනීම<br>iv. කුසලතා සංවර්ධනය හේතුවෙන් වඩා යහපත් සහ උසස් රැකියා ප්‍රතිශතයක් සහිත ජනගහන ප්‍රතිශතයක් | i. තරුණ රැකියා නියුක්තිය තහවුරු කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාත්මක කිරීමේ මාගී සිතියම ආධාර රටවල් වෙත භාරදීමට සූදානම්ය<br>ii. ජීවනෝපායන් යලි ආරම්භ කිරීමේ කාර්මික සහයෝගිතා වැඩ සටහන් ක්‍රියාත්මක වෙමින් පවතින තන්හී රැකියා වියුක්තිය ඉහල යාමේ ප්‍රමාණය 30% න් අඩු කිරීම.<br>iii. තරුණ පිරිස්/අඩු ආදායම් ලබන කොටස් විසින් ප්‍රයෝජනයට ගනු ලබන රැකියා වියුක්ති සේවා 10% කින් ඉහල යාම.<br>vi. වැඩිවූ නිපුනධාරිතාව හේතුකොට ගෙන නියමු ප්‍රදේශයන්හී ඉලක්ක කරගත් ජනගහනයෙන් 20% කට වඩා යහපත් රැකියා ඇත. |



**දෙවන ප්‍රතිඵලය**

## පුළුල් කම්කරු පරිපාලනය සහ සාධාරණ රැකියා භාවිතයන් ප්‍රවර්ධන කිරීම

සංවර්ධනය වන රටක් වශයෙන් පිරිවැය අවම මට්ටමකට ගෙන එමින් ගෝලීය කරණයේ ප්‍රතිලාභ උපරිම තලයකට පත් කිරීම ශ්‍රී ලංකාවට මහත් අභියෝගයක් වී ඇත. රැකියා වෙළඳ පොලේ කාන්තාවන්ගේ බහුල තත්ත්වයකින් පවතින්නා වූ දායකත්වය සමග ස්වක ස්ථරයේ දායකත්වය පසුගිය දසකය කිපයක තුල සැළකිය යුතු අන්දමින් වර්ධනය වුවද, ඒ ගැන සසදා බලද්දී ස්වක ස්ථරය වර්ධනය වී ඇත්තේ ඉතා සුළු අන්දමින් බව සංඛ්‍යා ලේඛණ පෙන්වා දෙයි. එසේම රටේ විරැකියාවද, සැළකිය යුතු අන්දමින් ඉහළ නැග ඇත. විශේෂයෙන් තරුණ කැළ, පිරිමි සහ කාන්තාවන් අතර මෙම විරැකියාව ඉහළ මට්ටමකින් පසුවන බවද රට වර්ග කර ඇත. අවිධිමත් ආර්ථිකය, ආර්ථික ක්ෂේත්‍රයේ අනෙකුත් ආර්ථික ව්‍යුහය තුලද, රැකියා වෙළෙඳ පොලේද, මහත් බලපෑමක් ඇති කර ඇත[1]. මෙම බලපෑම රට තුල වූ රැකියා ඉල්ලුමේ 63% ක් සපුරන්නේය[2]. අවිධිමත් ආර්ථිකය තුල ඇති ප්‍රධාන රැකියා : කෘෂිකර්මය (මෙහි ස්වයේ නියුක්ත අවිධිමත් ස්වක පිරිස 84% ටත් අධිකය), පතල් සහ ගල් කොරිවල රැකියා (අවිධිමත් 55%), හෝටල් සහ සුළු භෝජනශාලා (අවිධිමත් 55%), නිෂ්පාදන ක්ෂේත්‍රය (46%), අධ්‍යාපනය (අවිධිමත් 15%). ජන සංඛ්‍යා හා සංගණන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛණ අනුව කෘෂිකර්මාන්තය නොවූ රැකියාවන්හි 51% ක් පමණ වූ කොටසක් අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රය තුල නිරතව සිටින්නෝය. මෙම රැකියා ක්ෂේත්‍රය තුල නිරතව සිටින්නන් අධ්‍යාපනය අතින් ඉතා අඩු මට්ටමක පසුවන අතර, තාවකාලික ස්වරැකියාවන්හිද නිරතවූ ස්වකයන් (47%) කි. මොවුන් අඩු ආදායම් මට්ටමක් තුල නිසිආරක්ෂාවක් නැතිව මෙන්ම කිසිදු ප්‍රමිතියෙන් තොර, නොවන්නට නුසුදුසු නීති රාමුව තුල ස්වය කරන්නෝය. ස්ව්‍ය හා ස්වක යන දෙපාර්ශයම, ප්‍රතිසංස්කරණ වලට අවශ්‍යතාවය අවධාරණය කරති. එහෙත් අවශ්‍ය ප්‍රති සංස්කරණයන්හි ස්වභාවය සහ ඒවා කෙතරම් දුරට අවශ්‍ය ද යන්න පිළිබඳව පොදු සම්මුතියකට එළඹීම දුෂ්කර වී තිබේ.

මෙම පසුබිම යටතේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය පහත සඳහන් අවශ්‍යතා අවධාරණය කර තිබේ.

- **සුනිසි රැකියා සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියම.**
  යහපත් රැකියා පිළිබඳ න්‍යාය පත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාල සියළුම පාර්ශවයන්ගේ කැපවීම හා සහයෝගිතාවය අවශ්‍යය. රැකියා ඇති කිරීම, ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්, සමාජ සංවාදය හා සමාජ සුරක්ෂිතභාවය වැනි අවශ්‍යතා සපුරාලීම සඳහා මාර්ග සිතියමක් මෙහිදි අවශ්‍ය වේ. සුනිසි රැකියා පිළිබඳ ජාතික සැලැස්ම නිර්මාණය කිරීමේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් උපරිම දායකත්වය ලැබී තිබේ. මෙහිදී සම්මුතීන් ක්‍රියාවට නැංවීම, ශ්‍රම අධීක්ෂණ සහ ශ්‍රම වෙළඳපල විශ්ලේෂණ සහ පර්යේෂණ වැනි කරුණුවලදී කම්කරු සබඳතා අමාත්‍යාංශයට මෙන්ම එයට අනුබද්ධිත අනෙකුත් ආයතනවලටද, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මග පෙන්වීම හා උපකාරය අවශ්‍ය වී තිබේ.

- **සමාජ රක්ෂණ යෝජනා ක්‍රම පුළුල් කිරීමේ උපාය මාර්ග.**
  සියලු දෙනාටම ප්‍රයෝජනවත්වන සමාජ රක්ෂණය පිළිබඳ කාර්යක්ෂම පද්ධතියක අවශ්‍යතාවය අර්ථවත් කම්කරු පරිපාලනයක් විසින් අවධාරණය කරනු ලබයි. සමාජ රක්ෂණය පිළිබඳ හරවත් පද්ධතියක් ඉලක්ක කරගත් නව මාදිලියේ උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සැලසුම් කිරීම පිණිස රජය, අනෙකුත් ආයතන සහ සමාජයේ වෙනත් පාර්ශවකරුවන් සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ උපකාරය අවශ්‍යය. එබැවින් විවිධ සෞඛ්‍ය හා සමාජ රක්ෂණ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී, ඒවාට සම්බන්ධ ප්‍රධාන වගකිවයුතු පිරිස්, සමාජ පාර්ශවකරුවන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ තාක්ෂණික කුසලතා බෙහෙවින් වැදගත් වේ.

- **පුළුල් ජාතික වේතන ප්‍රතිපත්ති කෙටුම්පත.**
  කම්කරු පරිපාලනය අර්ථවත් අයුරින් සපුරාලීමේදී, ශ්‍රී ලංකාව සඳහා පුළුල් ජාතික වේතන ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍යය. අවම වේතනය, රාජ්‍ය අංශයේ වේතන තීරණය කිරීම, වේතන පිළිබඳව ස්වක-ස්ව්‍ය සම්මුතිය කාර්ය සාදනයට අදාල වේතන ක්‍රම යනාදිය සම්බන්ධයෙන් වේතන-තීරණය කිරීමේ ආයතන සහ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවති. එබැවින් පුළුල් ජාතික වේතන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සඳහා දැනට පවත්නා කම්කරු ව්‍යවස්ථා විමර්ෂනයට ලක්කළ යුතුව තිබේ.

- **සංක්‍රමණය පිළිබඳ කෙටුම්පත් ප්‍රතිපත්තියක් නිර්මාණය කර ශ්‍රී ලංකා රජයට ඉදිරිපත් කර තිබේ.**
  ශ්‍රී ලංකාවේ රැකියා ඇති කිරීමේදී දේශීය සහ විදේශීය රැකියා වෙළඳපලේ පවත්නා කුසලතා සංවර්ධනය පිළිබඳ අඩුපාඩු (ජීවන කුසලතා, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය) විශාල බාධාවක් තිබේ. සංක්‍රමිකයින් වශයෙන් මේ වන විට ශ්‍රී ලාංකිකයින් දශලක්ෂ 1.2 ක් පිටරටවල රැකියාවල නිරත වී සිටින බැව් වාර්තාවේ. පුහුණු ශ්‍රමිකයින් යැවීම සඳහා ශ්‍රී ලංකා රජය දිරිගැන්වීම් සපයා ඇති නමුත්, සංක්‍රමික ශ්‍රමිකයන්ගෙන් 72% ක්ම නුපුහුණු ගණයට ඇතුලත් වේ. එය ශ්‍රී ලංකාවට මහත් ගැටළුවක් වී තිබේ. ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකාව සතු ප්‍රතිපත්තියක්ද නොමැතිය.



[1]UNDP, Human Development Report 2007-2008 (available at http://hdrstats.undp.org).
[2]Deparment of Census and Statistics, Ministry of Finance and Planning, Sri Lanka Labour Froce Survey, Final Report, 2006, available at: www.statistics.gov.lk

ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පිට සංක්‍රමණය පිළිබඳව ජාත්‍යන්තර කම්කරු සංවිධානය දැනට කෙටුම්පත් ප්‍රතිපත්තියක් සකස්කරමින් සිටි. සංක්‍රමණය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව සහ පාලනය, සමාජ රක්‍ෂණය සහ සේවා කොන්දේසි පිළිබඳ කරුණු, සහ මූලාශ්‍රයට හා ගමනාන්තයට අත්වන ආර්ථික ලැබීම් සහ වාසි යනාදිය මෙහිදී සැලකිල්ලට භාජනය වනු ඇත. මෙමගින් ශ්‍රී ලංකා රජයට සංක්‍රමණය පිළිබඳ පුළුල් ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට හැකියාව උදාවනු ඇත.

- **කුඩා ළමුන් රැකියාවන්හි නිරත වීමෙන් ඉවත් කර ගැනීමේ ක්‍රියාදාමය සංවර්ධනය කිරීමේදී කළ යුතු මූලෝපාය සහ වැඩ සටහන්**
  ලාබාල වයසේ සේවකයන් සඳහා වූ ජාතික සංඝණනය අනුව ලංකාව තුල වෙසෙන ළමුන් අතරින් 927,037 දෙනෙකු පමණ ආර්ථික මට්ටමින් සරු අය වේ යැයි සොයාගෙන ඇත[3]. කෙසේ වුවද, මෙම සංඛ්‍යාව යම් ආකාරයකින් ආර්ථික කෙෂ්ත්‍රය තුල කුඩා අයද නිරතව ඇත යන්න මනාව සනාථ කරන්නේය. මොවුන් පාසලට යන සමයේ නොවන්නට වෙනත් අධ්‍යාපනික නිකේතන වලට අධ්‍යාපනය හැදෑරීමට යන සමයේ මෙවන් ආර්ථික කටයුතුවල නිරත වන්නෝය. මෙසේ සේවයේ නියුතු සංඛ්‍යාව පාසැල් සිසුන්ගෙන් 52 ක් වන අතර ඔවුන් අවුරුදු 15 ටත් අඩු අය බව සමීක්‍ෂණ තුලින් පෙනී ගොස් ඇත. මෙම සංසිද්ධියට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇති කරුණක් වන අතර, අඩු වයස් සේවකයන් ගැනවූ දෙවන සමීක්‍ෂණයක් පවත් වන්නට ත්‍රිපාර්ෂවික ක්‍රියාදාමයක් දියත් කර ඇත. මෙම සමීක්‍ෂණය තුලින් ලංකාව තුල සේවයෙහි නියුතු අඩුවයස් සේවකයන් ගැනවූ වාර්ථාවක් ලබා ගත හැකි වනු ඇත.

- **එච්. අයි. වී. සහ එඩ්ස් රෝගය සම්බන්ධ සංඛ්‍යා ලේඛණයක් සකස් කර ගැනීම සඳහා වූ ක්‍රියාදාමයකට ඒකාබන්ධ සාදක පරිපාටියක් සහ වැඩසටහන් මාලාවක් සකස් කිරීම**
  ලංකාව තුල එච්. අයි. වී. සහ එඩ්ස් රෝගය සම්බන්ධ ඒකාබද්ධ වූ ක්‍රියා පරිපාටියෙහි සංවර්ධිත බලපෑමක් තුලින් දේශිය ලෙස දායකත්වය ලබා දෙන්නන් සහ ජනසංඛ්‍යා සහ සංඛ්‍යා ලේඛණ සංවිධානවල අධික වන සේවා කටයුතු විමධ්‍ය ගත කරනු ලබනු ඇත.

- **අවිධිමත් අංශය පිළිබඳ දැනුම් සමුදාය**
  ශ්‍රම බලකායෙන් 60% ක්ම අවිධිමත් අංශය නියෝජනය කරන බැවින්, එම අංශය සඳහා දැනුම් සමුදායක් පිහිටුවීම පිණිස ජාත්‍යාන්තර කම්කරු සංවිධානය උපකාරී වනු ඇත. මෙම දැනුම් සමුදාය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ අනෙකුත් ආයතන සතු අනාගත ප්‍රතිපත්ති සහ වැඩ සටහන් වලට මග පෙන්වනු ඇත.

**උපාය මාර්ගික වැඩ සටහන**

අ. කම්කරු පිරික්සුම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ගේ භාවිතය පිළිබඳව දිරිමත් කරන ලද කම්කරු ආයතන සඳහා ශිල්පීය සහ උපදේශාත්මක සේවා සැපයීම.
ආ. ජාතික සමාජ රක්‍ෂණ ප්‍රතිපත්ති සැකසීම සඳහා ශ්‍රී ලංකා රජයට උපදේශාත්මක සේවා ලබාදීම.
ඇ. ජාතික වේතන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ශ්‍රී ලංකා රජයට ශිල්පීය සහ උපදේශාත්මක සේවා සැපයීම.
ඈ. ජාතික සංක්‍රමණික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ශ්‍රී ලංකා රජයට ශිල්පීය සහ උපදේශාත්මක සේවා සැපයීම.
ඉ. ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශය සඳහා දැනුම් සමුදායක් පිහිටුවීම පිණිස ශිල්පීය සහයෝගය සහ පර්යේෂණ පැවැත්වීම.

| දර්ශක | අරමුණ |
|---|---|
| i. කම්කරු පිරික්සුම ශක්තිමත් කරන ලදි.<br>ii. සමාජ රක්‍ෂණය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති පිළිබඳ කෙටුම්පත නිමකරන ලදි<br>iii. ජාතික වේතන ප්‍රතිපත්තිය සැකසිණි<br>iv. ජාතික සංක්‍රමණික ප්‍රතිපත්තිය සැකසිණි<br>v. අවිධිමත් අංශයේ දැනුම් සමුදාය නිම කිරීම | i. කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු පිරික්සුම 25% කින් ඉහල දැමීම.<br>ii. රජයේ සමාජරක්‍ෂණ වැඩ සටහනට අන්තර් අමාත්‍යාංශ කමිටුවක්<br>iii. 2010 වන විට ජාතික වේතන නිර්ණය ප්‍රතිපත්තිය හරහා වේතන පිළිබඳව තීරණ ගැනීම.<br>iv. විදේශ රැකියා කායඹාංශය වෙත කෙරෙන පැමිණිලි 25% කින් අඩු කිරීම<br>v. අවිධිමත් අංශයේ ප්‍රතිපත්ති සැකසීමේ කාර්යය සඳහා දැනුම් සමුදාය ප්‍රයෝජනයට ගැනීම. |

[3]Deparment of Census and Statistics - 1999

**තෙවන ප්‍රතිඵලය**

**රැකියා සුරක්ෂිතභාවය සහ තරඟකාරිත්වය සහ ඵලදායිතාව සම්බන්ධ කෙරෙන ක්‍රියාමාර්ග පිළිබඳ ත්‍රෛපාර්ශ්වීය සහයෝගිතාවය වැඩි දියුණු කිරීම.**

ජාතික සංවර්ධන ක්‍රියාවලියට සමාජ පාර්ශවකරුවන් සහභාගිවීම ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කරන ලද වගවීම සහ පාරදෘශ්‍යභාවය මගින් යහපාලනය තහවුරු කිරීම සහතික කරනුවස් අවශ්‍ය සමාජ සංවාදය අවධානයට ලක්කරවීම මෙහි අරමුණයි. සමාජ සහ ආර්ථික ප්‍රතිපත්ති නිර්ණය කරමින් සමාජ සංවාදය සඳහා වැදගත්වන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම මෙහි ඉලක්කය වී තිබේ.

කාර්මික සබඳතා සහ ගැටලු නිරාකරණයෙහිලා ශ්‍රී ලංකා රජය සුවිශේෂි කාර්යභාරයක් ඉටුකරයි. මෙය බොහෝ විට සිදුවන්නේ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග හරහා මිස සමාජ පාර්ශවකරුවන් අතර සංවාදයකින් නොවේ. ත්‍රෛයිපාර්ශ්වීය ව්‍යුහයන් තිබුණමුත් ජතික මට්ටමින් ප්‍රතිපත්තියක් සකස් කරනුවස් සමාජ පාර්ශවකරුවන් සතු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රයත්න දැරීමක් සිදු නොවිය. 2001 දී යලි පනගන්වන ලද ජාතික කම්කරු උපදේශක සභාව ආරම්භයේදී ත්‍රෛපාක්ෂික වේදිකාවක් සැපයීම අරමුණුවුවද, සන්නිවේදනය සහ සාකච්ඡා කටයුතු සඳහා වඩා හරවත් වේදිකාවක් සපයා තිබේ. කෙසේ වුවද, මෙතෙක් ජාතික කම්කරු උපදේශක සභාව ත්‍රෛයිපාර්ශ්වීය වශයෙන් තීරණ ගැනීමේ යාන්ත්‍රණයක ස්වරූපයෙන් කටයුතු කර නොමැත.

එබැවින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අවධානය පහත සඳහන් දරුණු වෙත යොමුවී තිබේ.

- **වඩා යහපත් සමාජ සංවාද යාන්ත්‍රණයක් සඳහා සමාජ පාර්ශවකරුවන් සතු ධාරිතාව ශක්තිමත් වී තිබේ.**
  ත්‍රෛයි පාර්ශවීය ව්‍යුහය ජාත්‍යන්තර කම්කරු සංවිධානය සතු ප්‍රබල මෙවලමකි. රැකියා සුරක්ෂිතභාවය සහ ඵලදායිතාව මල්පල ගැන්වීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ත්‍රෛයිපාර්ශ්වීය සහයෝගිතාවය පහසු කරවනු ලබයි. එමගින් සියළු දෙනා සඳහා සමස්ථයක් වශයෙන් යහපත් රැකියා සැපයීම පිණිස යාන්ත්‍රණයක් පිහිටුවනු ඇත.
- **ආරාවුල් නිරවුල් කිරීමේ ක්‍රියාදාමය ආරම්භකර තිබේ.**
  වරින්වර පැන නැගෙන සේවක දුක්ගැනවිලි සහ ගැටුම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා විධිමත් හෝ අවිධිමත් යාන්ත්‍රණ නොමැතිවීම නිසා සමාජ සංවාද සංස්කෘතියක් පිහිටුවීම මෙන්ම ජාතික සංවර්ධනය නගා සිටුවීම මහත් අභියෝගයක් වී තිබේ. රාජ්‍ය අංශයේ වෘත්තිය සමිති සාම්ප්‍රදායිකව දේශපාලන පක්ෂ සමානව සම්බන්ධවී සිටින බැවින්, සංවාද හෝ සාකච්ඡා මගින් ස්වකීය අර්බුද විසඳගන්නවා වෙනුවට හුදෙක් දේශපාලන මැදිහත්වීම් හරහා එය සපුරනු ලැබේ. මේ නිසා ස්ථිරසාර විසඳුම් වෙනුවට වරින්වර සිදුවන දේශපාලන වෙනස්වීම් නිසා අතිරේක ගැටුම් හෝ අර්බුද පැන නැගීම නොවැලැක් විය හැකිය. ඉන් ආර්ථිකයට සිදුවන්නේ අයහපතකි.

**උපාය මාර්ගික වැඩ සටහන**

(අ) ලෝකයේ සිදුවන සමාජ-ආර්ථික වෙනස් වීම් (නිදසුන් : රැකියා සුරක්ෂිතභාවය, ඵලදායිතාව සහ තරගකාරිත්වය) සම්බන්ධයෙන් ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වෘත්තිය සමිති සහ හාම්පුතුන්ගේ සංවිධාන වෙත ශිල්පීය සහ උපදේශාත්මක සහයෝගය ලබාදීම,

(ආ) පෞද්ගලික සහ රජය අංශයන්හි රැකියා සුරක්ෂිතභාවය, ඵලදායිතාව සහ තරගකාරීත්වය වැඩි දියුණු කළ සංවාද යන්ත්‍රණ පිළිබඳව ත්‍රෛයිපාර්ශ්වීය සහයෝගිතාවය ආරම්භ කරනුවස් රජයට ශිල්පීය සහ උපදේශාත්මක වශයෙන් සහයෝගය ලබා දීම.

| දර්ශක | අරමුණු |
|---|---|
| I. පර්යේෂණ සහ ඒකාබද්ධ වැඩ සටහන් හරහා සේව්‍ය/සේවක පාර්ශව ජාතික සංවර්ධනයට සාර්ථක අයුරින් දායකවෙති<br>ii. රජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ගැටුම් හෝ ආරාවුල් නිරාකරණය කිරීම සහ රජය විසින් යොදා ඇති හරවත් සමාජ සංවාද යාන්ත්‍රණ | i. රාජකාරී ස්ථානයන්හි ජාතික ඵලදායිතා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සේව්‍ය/සේවක සංවිධාන විසින් ගෙන ඇති පියවර සංඛ්‍යාව<br>ii. 2012 දි රාජ්‍ය සේවාව තුල කම්කරු ආරාවුල් 60% න්ද, පෞද්ගලික අංශයේ කම්කරු ආරාවුල් 20% කින්ද අඩුවේ |



## ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ව්‍යුහය

සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන ලෝක සෞඛ්‍ය සංවිධානය කම්කරු සහ මිනිස්බල අමාත්‍යාංශය, සේව්‍ය/සේවක සංවිධාන සහ අනෙකුත් අදාල පිරිස් විසින් ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ඇත. සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන් සැලසුම් කිරීම, සම්පත් යොදා ගැනීම, අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම උදෙසා ජාතික මට්ටමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය ත්‍රෛයිපාක්ෂික පිරිස් සහ අනෙකුත් ප්‍රධාන වගකිවයුතු කොටස් සමග කටයුතු කරනු ඇත. ව්‍යාපෘති උපදේශක හා මෙහෙයුම් කමිටුව වැනි පරිපාලන යාන්තන වලටද ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහභාගි වනු ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානය එක්සත් ජාතීන්ගේ නේවාසික ක්‍රියාකාරි කංඩායමේ ප්‍රධාන පෙළේ සාමාජිකයෙකි. තවද එය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, යුනිසෙෆ් සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක ආහාර වැඩ සටහන සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි ප්‍රධාන පෙළේ ආයතන සමග කිට්ටු සබඳතා ගොඩනගා ඇත. එසේම ඒකාබද්ධ වැඩ සටහන් රාශියකම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය දැනටමත් කොටස් කරුවකු වී සිටි.

සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන ක්‍රියාත්මක කිරීම් වස් එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහන යටතේ, ඉහතින් සඳහන් කල ආයතන සමග සහයෝගීතාවය පවත්වා ගෙනයාම අපේක්ෂාව වී තිබේ. සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා ධාරිතාව ගොඩනැගීම, ටියුරින්හී ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ජිනීවා, බැංකොක් සහ දිල්ලි නගරවල නේවාසිකව සිටින විශේෂඥවරුන් සහ දේශීය වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයතුල විශේෂඥ දැනුම අනුසාරයෙන් ව්‍යාප්ත කරනු ලැබේ.

ස්වකීය ප්‍රතිඵල පදනම් කොටගත් කළමනාකාරණය සඳහා සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන මෙවලමක් වශයෙන් යොදා ගන්නා ජාත්‍යන්තර කම්කරු සංවිධානය අවශ්‍ය නිශ්චිත ප්‍රමුඛත්ව සහ මූල්‍ය හා මානව සම්පත්ද අඳුනාගනිමින්, ත්‍රෛයිපාර්ශවීය කංඩායම් සමග දැවුරුදු සැලසුම් පිළියෙල කරනු ඇත.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය ස්වකීය ත්‍රෛයිපාර්ශවීය කංඩායම් සහ අනෙකුත් අදාල ආයතන සමග එක්ව අවශ්‍ය සම්පත් යොදා ගැනීම සඳහා සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන අධීක්ෂණය කිරීම සහ ඇගයීම මගින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය ජාතික සංවර්ධන අරමුණුවලට සහ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩ සටහනට කොතරම් දුරට ආධාර සපයන්නේද යන්න තක්සේරු කිරීමට හැකිවේ. යහපත් රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහන සජීවී ක්‍රියාවලියකි. අතීත අත්දැකීම් හා භාවිතයන් අනාගත සැලසුම් හා වැඩ සටහන් නිර්මාණය කිරීමේලා ප්‍රයෝජනවත් වේ.

කාලීන ත්‍රෛයාපාර්ශවීය උපදේශඥසේවා, ප්‍රගතිවාර්තා (අදාල පිරිස් සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කලාපීය කාර්යාලය සහ උපකලාපීය කාර්යාලය) සහ ස්වාධීන නේවාසික වැඩ සටහන් විමර්ශනය කිරීම වැනි යාන්ත්‍රණ ඵලදායී අධීක්ෂණ සහ ඇගයීමේ මෙවලම් වශයෙන් ක්‍රියා කරනු ඇත.





# 1වෙන ඇමුණුම

## එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන, සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන සහ දස අවුරුදු සංවර්ධන වැඩ සටහන අතර පවත්නා ප්‍රායෝගික සම්බන්ධතාවය

| එ.ජා.ස.වැ.ස ප්‍රතිඵලය 1 | සු.රැ.නේ.වැ ප්‍රතිඵලය 1 | ද.අ.ස.වැ | වැඩසටහන් සම්බන්ධතාවය |
|---|---|---|---|
| සහශ්‍ර සංවර්ධන අරමුණු සපුරාලීමේදි ආර්ථික වර්ධනය සහ සමාජ සේවා සාධාරණ හා දුගී දුප්පතුන්ට හිතකාරී සහ තිරසන් ස්වරූපයක් දරයි. ග්‍රාමීය පෙදෙස් විශේෂ අවධානයට ලක්කරයි | ආර්ථික වශයෙන් පසුබා සිටින සහ අර්බුධයට පාත්‍රවි ඇති ප්‍රදේශවල වැඩි වැඩියෙන් රැකියා සඳහා ප්‍රවේශය | ජාතික රැකියා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.<br><br>තරුණ පිරිස් රැකියාවල නිරත කිරීම වැඩි කිරීම.<br><br>කාන්තාවන් සඳහා වැඩි ආදායම් උත්පාදනයක් ඇති කිරීම.<br><br>විදේශ රැකියා අවස්ථා දිරි ගැන්වීම.<br><br>පුහුණු ශ්‍රමික සංක්‍රමණය වැඩි කිරීම.<br><br>නවීන අවශ්‍යතා සපුරාලීම පිණිස දැනට පවත්නා උපාධිධාරීන්ට වැඩ සටහන් ප්‍රතිශෝධනය කිරීම. | සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනට පස් ආකාරයකින් පහත සඳහන් පරිදි දායක වේ. තරුණ රැකියා, සුනාමි සහ අර්බුධවලට පාත්‍රවූ පෙදෙස්වල රැකියා ඇති කිරීම මගින් ශ්‍රම වෙළඳපල ඉල්ලීම ශක්තිමත් කිරීම, සුනාමි සහ අර්බුධයට ගොදුරුවූ පෙදෙස්වල රැකියා ඇති කිරීම, රැකියා සේවා ලබා දීමට සහායවීම, ඵලදායිතාව වැඩි කිරීම මගින් සුළු සහ කුඩා ව්‍යවසාය සංවර්ධනයට සහය වීම. |
| **එ.ජා.ස.වැ.ස ප්‍රතිඵලය 2** | **සු.රැ.නේ.වැ ප්‍රතිඵලය 2සහ3** | **ද.අ.ස.වැ උපායමාර්ග** | **වැඩසටහන් සම්බන්ධතාවය** |
| පාලනයට යොදා ගන්නා යාන්ත්‍රණ සහ භාවිතයන් සහස්‍ර ප්‍රකාශනයේ මූලධර්ම සාක්ෂාත්කර ගැනීමට උපකාරී වන අතර සියලු පුද්ගලයින්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා සුරැකීම සිදුකරයි. | ප්‍රතිඵලය 2 : වැඩිදියුණු කළ කම්කරු නීති සහ භාවිතයන් | අවිධිමත් අංශය තුල රැකියා අවස්ථා ක්‍රමවත් කෙරේ.<br><br>උපදේශක සේවා මගින් කම්කරු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරේ.<br><br>බලාත්මක කිරීම කටයුතු/කම්කරු දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩි දියුණු කරයි.<br><br>සමාජ සුරක්ෂිතභාවය වැඩිදියුණු කරයි. OSH වැඩි දියුණු කරයි.<br><br>ජාතික ඵලදායිතාව වැඩි දියුණු කිරීම: සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාර අරමුදල් නීති රීතිවලට අනුකූලව ක්‍රියාකිරීම | ශ්‍රම වෙළඳපල ආයතනවලට රැකියා උත්පාදනය කිරීමේ පලමු ප්‍රතිපලය පහසුකරලීමට හැකි බව සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහනේ දෙවන ප්‍රතිඵලය මගින් තහවුරු කරයි. සමාජ ආරක්ෂණය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සඳහා රජයට ශිල්පීය සහය සපයා දීමේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩ සටහනේ අරමුණුවලට අනුකූලව වෘත්තිය පුහුණුව, කම්කරු පාලනය, කම්කරු නීති ක්‍රියාත්මක කිරීම සහ අර්බුද නිරාකරණය කිරීම ඉලක්ක කර ඇති ප්‍රධාන අංශයේ වෙති. |
| | ප්‍රථිඵලය 3 : රැකියා සුරක්ෂිතභාවය ඵලදායිතාවය සහ තරගකාරීත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩි දියුණු කරන ලද ත්‍රෛයි පාර්ශවීය සහයෝගිතාවය | රාජ්‍ය අංශයේ ආරාවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම. | මෙම ප්‍රතිඵලයේදී යහපත් රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහනේ අවධානය යොමු වී ඇත්තේ පලමු ප්‍රතිඵල දෙකෙන් හටගත් බලපෑම් සංවාදයක් හරහා බද්ධ කිරීම කෙරෙහිය. මෙමගින් වගකීම හා පාරදෘෂ්‍යභාවය හරහා යහ පාලනය පහසු කරවන ප්‍රවේශයක් මගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට පහසුව සැලසෙන බව තහවුරුවේ. |

## 1වෙන ඇමුණුම
## එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන, සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩසටහන සහ දස අවුරුදු සංවර්ධන වැඩ සටහන අතර පවත්නා ප්‍රායෝගික සම්බන්ධතාවය

| එ.ජා.ස.වැ.ස ප්‍රතිඵලය 3 | සු.රැ.නේ.වැ ප්‍රතිඵලය | ද.අ.ස.වැ | වැඩසටහන් සම්බන්ධතාවය |
|---|---|---|---|
| සමාජ යුක්තිය සහ ප්‍රතිසන්ධානය තුල රඳවා ඇති තිරසාර සාමය සඳහා දියුණු පරිසරයක්. | | | සුනිසි රැකියා පිළිබඳ නේවාසික වැඩ සටහනට සාමය සෘජුව ඉලක්ක කරගත් ක්‍රියා පිළිවෙලක් නොමැතිවුත්, එහි වැඩ සටහන් බොහෝමයකට කුරුමානම වී ඇත්තේ අවතැන්වූවන් තම සුදුරුදු රැකියා අපේක්ෂාවෙන් කල්ගෙවන, යුධයෙන් බැට කෑ ළමුන් ජීවත්වන සහ කලින් යුද්ධයේ නිරතව සිටි පිරිස් ජීවත්වන පෙදෙස්වල සාමය යලි ස්ථාපනය කිරීමය. අර්බුද නිරාකාරණය කිරීමේ වැඩ සටහන් අර්බුදයට ගොදුරු වු පෙදෙස්වල යලි ක්‍රියාත්මක කළ හැකිය. |
| **එ.ජා.ස.වැ.ස ප්‍රතිඵලය 4** | **සු.රැ.නේ.වැ ප්‍රතිඵලය** | **ද.අ.ස.වැ** | **වැඩසටහන් සම්බන්ධතාවය** |
| දේශපාලන, ආර්ථික හා සමාජ ජීවිතයේදී සාධාරණ හා සමාන අයුරින් දායක වීමටත් ප්‍රතිලාභ භුක්තිවිඳීමටත් කාන්තාවන් තවදුරටත් බලාත්මක කරනු ඇත. | | | ලිංගබේදයෙන් තොර සමානත්වය හා සාධාරණත්වය තහවුරු කිරීම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රධාන ක්‍රියාකාරී වැඩ සටහන වී ඇත. තෛයිපාර්ශවීය හවුල් කරුවන්ගේ ධාරිතාව ගොඩ නැගීම කෙරෙහි විශේෂ අවධානය යොමුවේ. |

මහින්ද මඩිහහේවා
ලේකම්
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය

රවි පීරිස්
අධ්‍යක්‍ෂ ජනරාල්
ලංකා සේවා සම්මේලනය

ලෙස්ලි දේවේන්ද්‍ර
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය

ඩී. ඩබ්ලිව් සුභසිංහ
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා වෘත්තීය සමිති සම්මේලනය

පාලිත අතුකෝරල
ප්‍රධාන සංවිධායක
ජාතික සේවක සංගමය

එම්. ආර්. ෂා
සභාපති
ලංකා බැංකු සේවක සංගමය

නාත් අමරසිංහ
ප්‍රධාන ලේකම්
ලංකා වතු සේවක සංගමය

ටින ස්ටැමෝස
අධ්‍යක්‍ෂිකා
ජාත්‍යන්තර කම්කරු සංවිධානය-ශ්‍රී ලංකාව

ටී.එම්.ආර්. රසීඩීන්
ප්‍රධාන ලේකම්
කම්කරු සංගම් සඳහා වූ ජාතික පර්යේෂණ සහ අධ්‍යාපන ආයතනය (NATURE)

හැරී සන්ද්‍රසේකර
උප සභාපති
ලංකා කම්කරු කොංග්‍රසය

ජෙරාල්ඩ් ලොඩ්වික්
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්
ජාතික කම්කරු සංගමය


කේ. වේලායුදම්
ප්‍රධාන ලේකම්
ලංකා ජාතික වතුකම්කරු සංගමය

සමන් රත්නප්‍රිය
සම කැඳවුම්කරු
සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානය

ඇන්ටන් මාර්කස්
ප්‍රධාන ලේකම්
නිදහස් වෙළඳ කලාපය සහ පොදු සේවා සංගමය



ඩී. එස්. එදිරිසිංහ
කම්කරු කොමසාරිස්
කම්කරු දෙපාර්තමේන්තුව



ඩී. සී. වීරසේකර
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා නිදහස් රජයේ වෘත්තිය සමිති සම්මේලනය




ඩබ්ලිව්. එච්. පියදාස
ප්‍රධාන ලේකම්
රාජ්‍ය සේවා වෘත්තිය සමිති සම්මේලනය



අධිකාරි ජයරත්න
ප්‍රධාන ලේකම්
රාජ්‍ය නිදහස් වෘත්තිය සමිති සම්මේලනය



පී. කේ. පියදාස
සභාපති
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකාර සහායක නිලධාරීන්ගේ සංගමය



පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි
සභාපති
රාජ්‍ය සේවා එක්සත් හෙද සේවා සංගමය

